# සීගිරි සිතුවම් මගින් හෙළි වන පැරණි සමාජයේ සංස්කෘතික පසුබිම

ඩබ්.එම්.අයි. දිල්හානි[1]

ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුම ඉතිහාසය පිළිබඳව අවධානය යොමුකිරීමේදී සිගිරි බිතුසිතුවම්වලට ඉතා වැදගත් ස්ථානයක් හිමි වේ. මෑතකාලීන ඉතිහාසඥයන්ගේ හා පුරාවිද්‍යාඥයන්ගේ මෙන්ම විද්වතුන්ගේ ද අවධානය යොමු වූ ඉතා වැදගත් පුරාවිද්‍යාත්මක ස්ථානවලින් එකක් ලෙස සීගිරිය පෙන්වාදීමට හැකිය. සීගිරිය ආගමික මෙන්ම රාජකීය වශයෙන් පමණක් නොව සෞන්දර්යාත්මක අතින් ද උසස් ගණයේ ලා හැකි අසාමාන්‍ය නාර්මාණයකි. මෙය ආරක්ෂිත බලකොටුවක් ලෙස ද වංසකතාකරුවන් දක්වා ඇත. මෙහි ඇති වාස්තුවිද්‍යාත්මක හා කලා නිර්මාණ, ලොව අන්කිසිදු තැනක දක්නට ලැබෙන මෙම යුගයේ අනෙක් නිර්මාණ සමඟ නොදෙවෙනි වේ. කිසියම් වූ කලා නිර්මාණයක් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එහි කලාත්මක බව පිළිබඳව පමණක් නොව එමගින් හෙළිවන තොරතුරු පිළිබඳව අවධානය යොමුකළ යුතුය. ඒ අනුව සීගිරි සිතුවම් එවැනි ආකාරයේ උසස් ගණයේ ලා හැකි කලා නිර්මාණයකි. සීගිරි පර්වතය ලොව වඩාත් ජනප්‍රිය ස්ථානයක් බවට පත්ව ඇත්තේ සීගිරි පර්වතයේ බටහිර අඳින ලද කාන්තා රූප සමූහය නිසාවෙනි. සිතුවම් මඟින් නිරූපණය කෙරෙන්නේ කුමක් ද යන්න පිළිබඳව විවිධ විද්වතුන් විවිධ මත ඉදිරිපත් කර ඇතත් ඒ පිළිබඳ නිශ්චිත මතයක් ඉදිරිපත් කර නොමැත. කෙසේ නමුත් මෙම සිතුවම් මඟින් හෙලිවන සමාජ හා සංස්කෘතික අනන්‍යතාවය විවිධ පැතිකඩ ඔස්සේ හඳුනාගැනීමට හැකියාව ලැබේ. විශේෂයෙන් එහිදී එකල සමාජ පසුබිම, රාජකීයත්වය, දේවත්වය, ස්ත්‍රී ලාලිත්‍ය, විලාසිතා, සංවරබව, ආර්ථිකය, ආදී වූ විවිධ අංග හඳුනාගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් එකී අංශ පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. මෙම පර්යේෂණ පත්‍රිකාවේ පර්යේෂණ ගැටලුව වන්නේ සීගිරි බිතුසිතුවම් තුළින් හෙලිවන සමාජ සංස්කෘතික තොරතුරු මොනවාද යන්න අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා පුස්තකාල පරිශීලනය මගින් ඒකරාශී කරගන්නා ලද තොරතුරු මූලාශ්‍රය කරගෙන ඇත. ඒ අනුව සීගිරි බිතුසිතුවම් මගින් හෙළිවන සංකේතාර්ථ හඳුනාගැනීම ඉතා වැදගත් කොට සැලකිය හැකිය. නූතන සමාජ ක්‍රමයෙන් ඈත් වී යන ශ්‍රී ලංකාවේ පැරණි සමාජ සංස්කෘතික තත්ත්වයන් නැවත ඉස්මතු කරගැනීම මෙන්ම සීගිරියෙන් හමුවන බිතුසිතුවම් මගින් එකල සමාජයේ පැවැති පන්ති ක්‍රමය, ස්ත්‍රීන් අතර පැවති වෙනස්කම් පමණක් නොව ආර්ථිකමය වශයෙන් සමාජය හැඩ ගැසී තිබූ ආකාරය හඳුනාගැනීම, විදේශීය සබඳතා මෙන්ම එකල පැවති ආධ්‍යාත්මික පසුබිම කෙතරම් දුරට එකල සමාජය තුළ විසිර පැතිරී තිබූ ආකාරය මෙම සිතුවම් හරහා ප්‍රකට වන්නේද යන්න අධ්‍යයනය කිරීම මෙමඟින් සිදුවේ.

ප්‍රමුඛ පද : සීගිරි සිතුවම්, පැරණි සමාජ සංස්කෘතිය, කලාත්මක, ශ්‍රී ලාංකේය ඉතිහාසය

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.isharawickramasinghe94@gmail.com